


"මේ දවස්වල ලැව් ගිනි !"

කොහේදෝ යන්න ලෑස්තිවෙන පැන්සලට පන්හිඳ කිව්වා."

"තණකොල කොලෙත් ගිනිගන්න තරමට රස්නෙයි. ගින්දර වාගෙ ඇඳුම් ඇඳගෙන එළියට බහින්නෙ බලාගෙන. ගිනි ගනියි !"

පැන්සල ඇඳගෙන උන්නෙ රතුපාට කමිසය-ක්. නිල්පාට "ඩෙනිම්" කලිසමට කොහෙත්ම ගැලපුනේ නෑ.
"වයසට එපායැ අඳින්න" පන්හිඳ කීවා. " තමුන්නාන්සෙත් වයසට නොවෙයි කියවන පොත් !" පන්හිඳ කියවා කියවා උන්නු පොත දිගා ආරෝවට වාගෙ බලන ගමන් පැන්සල කමිසය මාරු කරා.

හරිබරි ගැහුණා.



# සිසිර දිසානායක

කවිය ට අද ලැබෙන්නේ අඩු තක්සේරුවක්. කවියට වඩා ගීතය පිළිබඳව උනන්දුවක් ඇති මෙවන් යුගය, ගීතය වෙනුවෙන් දායකත්වය දක්වන දරුවන් වෙතින් කවිය පිළිබඳව යම් මෙහෙයක් කිරීමට ඉදිරිපත් වීම අගය කළ යුතු කාරණයක්. ගීයේ උපත කවිය යැයි බොහෝ දෙනා දරණ අදහසක්. දරුවන් විසින් තමන්ට ජන්මය දුන් සිය පියාණන් සිහිපත් කිරීම සඳහා එතුමන් විසින් පබැඳුන කවි එකතුවක් එළි දැක්වීම ගියට ජන්මය දුන් කවියට කරනා සත්කාරයක් ලෙසින් අප හට දැනෙයි.




"හිරිකුළු සොඳුර"
හිරිකුළුවේ සුසිල් ප්‍රේමසිරි කවියාගේ නිර්මාණ එකතුව
පිටකවරය - ජගත් ජේ එදිරිසිංහ

"බෙළි වනය", "තරුව", " අමාව", "අඹ වනය", "හඳ එළිය", "ගීතය", "මෝහිණී", " ආදරය" වැනි එකල මාසිකව නිකුත් වූ කවි සඟරා වෙනුවෙන් හිරරිකුළුවේ සුසිල් ප්‍රේමසිරි නම් වූ ප්‍රවීණ කවියාගේ පබැඳු නර්මාණ මෙම "හිරිකුළු සොඳුර" කවි එකතුවට එක් වෙයි. සියනෑ කෝරළයට අයත් වේයන්ගොඩ ප්‍රදේශයේ හිරිකුළුව මෙම කවියාගේ උපන් ගමයි. මුද්දරගම පිරිමි පාසැලින් හා මී ගොඩ පිරිමි පාසලින් අධ්‍යාපනය ලත් එතුමාගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය "ජීවිත පූජාව"යි රජයේ ගුරුවරයෙකු ලෙස සේවය කළ එතුමා විශ්‍රාම යනවිට විදුහල්පතිවරයෙකු ලෙස සේවය කරමින් සිටියේය.

සුසිල් ප්‍රේමසිරි කවියාගේ කවීත්වය හඳුනා ගත හැකි පහසුම ක්‍රම වේදය වන්නේ ඒ කවි පරිශීලනය කිරීමයි. නිදසුන් කිහිපයක් සමඟින් ඒ පිළිබඳව යම් ඉඟියක් පාඨකයාට ලබා දීමටයි මේ උත්සහය.......

කුල්මත් වෙලා - සිරිහර පැදි පෙළක    රසින්
කෙල්ලක් ඔකඳ වනවිට මුව පිරුණ    හඬින්
එල්වෙන් "හැඟුම" අගෙ හද පතුලටම    ගොසින්
බොල්/නැති රසිකකම යැයි මම කියමි    තොසින්

"රසිකත්වය" මැයෙන් ලියු කවි පෙළක මුල් කවියයි ඒ. පැදි පෙළක රසයෙන් කුල්මත් වූ යෞවනියක ඔකඳව සිනා නඟන කළ ඇයගේ හද පතුලටම ගොස් ඒ හැඟුම විඳගැනීමට ඇත්නම් නියම රසිකත්වය ඒ යැයි කවියා කියයි. එතුමන්ගේ චින්තන ශක්තිය කදිමට විදහා පාන කවියක් ඒ. රසිකත්වය පිළිබඳව තමන් දරන අදහස සරළ සුපුරු රූපකයක් මවා පාමින් අප වෙත කියා පාන්නේ අප හට යම් කිසි රසයක්ද දනවමින් නොවේද ? ඔකඳ වූ කෙල්ලකගේ සිනහව අප වෙත ගෙන දෙන්නේ සුන්දර චිත්ත රූපයක් නොවේද? කවියා එම චිත්ත රූපය තුලින් ඊට වඩා ගැඹුරු වූ තැනකට පාඨකයාව ගෙන යයි.

කවි පබැඳීමේ දී ප්‍රේමසිරි කවි වරයාණන් ශබ්ද රසය පිළිබඳවද උනන්දු වී ඇති බව මෙම කවියෙන් පෙනෙයි. පදයකට මාත්‍රා 19 බැගින් යෙදුනු විරිතකම ලියූ කවියේ දෙපළක එළිසමය පුරන්නේ ධවනි පූර්ණ ගුණය නැංවීමටයි. එතුමන් සෑම පදයකම මුල් වචනයේ දෙවැනි අකුර ලෙසින් "ල්" අකුරත්, අවසන් වචනය අගට "න්" අකුරත් යොදමින් මින් එළෙස දෙපළක එළිසමය රැක ඇත්තේය.

ජීවිතයේ යථාවබෝධය පාඨකයාට ළංකර දීම කලාකරුවන්ගේ යුතුකමක් සේම වගකීමක්ද වෙයි.

සමාජයේ ඇතැම් සිරිත් විරිත් පවා "සිදුවිය යුත්තෙන්" බැහැර වෙද්දී සුසිල් ප්‍රේමසිරි කවියා සිය පෑන මෙලෙසින් මෙහෙයවයි.....

එදා මහ දනකි; ගම අසළ    පන්සලේ
බෙදා තුබුණි; රසවත් අහර දන්    හලේ
නොදා බත් කටක් ගී පිරිස කොන්    කලේ
උදා වුණ හෙයිනි, නා හිමි ගෙ පින් බලේ

හිතේ දුක නැඟුණත් - නෙතේ නෑ එක කඳුලක් !

"දා", "න්", සහ "ලේ" යන අකුරු වලින් කවියේ තුන්පළකම එළිසමය රකිමින් කළ සිව්පද කවිය

# හිරිකුළු සොඳුර

අගට පස්වන පදයක්ද එක් කරමින් කවියා සිය නිර්මාණාත්මක බව පෙන්වයි. එම අවසන් පදයේද යම්කිසි රිද්මයක් හා තාලයක් කැවී ඇත්තේය. "මෙන්න මට ඇඬුණු දවස!" නමින් පළ වූ කවි පන්තියේ ඇති සෑම කවි පන්තියක්ම රචනා වී ඇත්තේ ඉහත දැක්වෙන රීතියටයි. මෙම කවි පන්තියේදී කවියා රිසිසේ "ඉංග්‍රීසි අප බස් වහරට එක් වූ පද ද යොදා ගනියි. "ඇසිටික් ඇසිඩ්" බොති ඇවිලී හිසේ ගිනී" එහි එන එක් පදයකි. එසේ වුවද කවියා තමන්ගේ කවි පෙළෙහි මාතෘකාව අනුව ඉතා සුනම්‍ය වූ වදනින් පද පබැඳීමෙහිද යෙදෙනුයේ සිය ව්‍යක්ත බව පෙන්වමිනි.

සුදගර ඉලූ ඇගෙ නළලත කියුඹු    වැලයි
මනහර සිළිටි දෙ-අතෙහි රැඳි වළලු    පෙළයි
සිරි ගර රසින් මද මත් නෙත බඹර    කැළයි
මෙම සුර සිහින සේයාවන් සැමට    මුලයි

"මුහුණුවර" නමින් පළවූ කවි පෙළෙහි එන ඉහත කවිය ඊට නිදසුන් දෙයි. ශෘංගාරයද කැටි කරවමින් පබැඳු කවි සඳහා නිදසුන් ද බොහෝ වෙයි. සිය ගම වන "හිරිකුළුව" ගම් වැනුම සඳහා ලියූ මුල් කවියෙන්ම එය කාන්තාවකට උපමා කරමින් රස මවන්නේ මෙලෙසිනි;

මී කිරි ඔඩම් යුගලක් වැනි සුපුන්    ළැමයි
සීගිරි ළඳක සුන්දර බව ඇගෙන්    නිමයි
ආදරියක්ව ඇය නැළැවෙනු එයින්    තමයි
මේ හිරිකුළුව දුප්පත් මගෙ උපන්    ගමයි

නිතර කවියන් භාවිතයට නොඑන විවිධ විරිත් අනුව ලියැවුණ කවි පන්තිවල අපූරුව අපහට විඳීමට සුසිල් ප්‍රේමසිරි කවියාණන් ඉඩ සළසාදුන් අවස්ථාවන් ගණනාවක්ම මෙම එකතුවෙහි වෙයි. මේ ඊට එක් නිදසුනකි;

තද ගිමනින් මිරිකුණු ලොව ගන අඳුරට    නෑවුණා
කොඳවමියන් සඳ කුමරිඳු පිළි ගැණුමට    පේවුණා !

කුසුම් බුරුතු නම නමා - නැවුම් සුවඳ පෙර පෙරා
එහෙන් මෙහෙන් හති දමා - සුළං රැළිද එය හමා

මුල් දෙපදයෙන් කියවෙන විරිත තරමටම සංවර නොවූ තුන්වන හා සිව් වන දෙපදයෙන් කිවෙන විරිත මදක් කලබලකාරි බවක් දනවයි. ඒ සුළං රැළි හමා එන ස්වාභාවයද? "සඳපහනේ මිහිරියාව" නම් වන මෙම කවි පෙළම ඉහත රිතියට අනුව ලියැවී ඇත්තේය.

ඉතා සුන්දර ලෙස යෞවන ආදරය දකිමින් එහි බොළඳ බව චමත්කාර ගැන් වූ කවි දෙපදයකි මේ..........

"කණාමැදිරියන් අල්ලලා - මාල ගොතන්නම්
මාල ගොතල මගේ සුදාගෙ කරේ බඳින්නම්.......

25 වන පිටට

"හිරිකුළු සොඳුර"....... ඈ......" පැන් පිටකවරයට එබුනේ පන්ට සමච්චලේට වාගේ.

"මොකක්ද මේකෙ ඇති වැරැද්ද? හිරිකුළුව කියන්නේ වේයන්ගොඩ පැත්තේ තියෙන ගමක්. තමුන්ගේ ගම ගැන ගමේ පරිසරය ගැන හිරිකුළුවේ සුසිල් ප්‍රේමසිරි කවියා ලියපු කවි පන්තියක් "හිරිකුළු සොඳුර" කියලා නම් කරලා තියෙන්නේ, හැබැයි පොතේ තවත් කවි පන්ති ගණනාවක්ම තියෙනවා........"

"ඔය අර "මිල්පාර්ක්" වල ඉන්න ප්‍රමිලා නංගිගේ තාත්තනේ හිරිකුළුවේ සුසිල් ප්‍රේමසිරි කියන්නේ කොළඹ යුගයේ ප්‍රසිද්ධ කවියෙක්. ප්‍රමිලා නංගී තමයි තමුන්ගේ තාත්තා ඒ කාලේ සඟරාවලට, උත්සව වලට එහෙම ලියපු කවි පන්ති එකතු කරලා ඔය පොත එළි දක්වලා තියෙන්නෙ......." පින්සලත් කතාවට හවුල් වුණා.

"ඒ කියන්නේ අපේ රෝහණ ධර්මකීර්තිගේ පියතුමා හොඳ කවියෙක් ? ඒ පැන්.

ලංකාවේ ඉන්න රෝහණ ධර්මකීර්ති මහත්තැන් අපූරුවට සංගීත නිර්මාණය කරන, බොහොම දක්ෂ විදියට වයලීනය වාදනය කරන විශාරදවරයෙක්. එයැයිගේ නංගී ප්‍රමිලා දමයන්ති ඉන්නෙ මෙල්බර්න් නුවර.

"මෙල්බර්න්වල ඉන්න ලලිත් අරුණ ශාන්ත ගායකයාගෙ තාත්තාත් කොළඹ යුගයේ කවියෙ-ක්. කැස්බෑවේ උන්නු හේමචන්ද්‍ර ගුණතිලක කවියා ගැන අහලා ඇතිනේ" පන් යමක් ලියන්න


